විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions
පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } Pen/Pol/06/11-2023

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024.10.10

**විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි :- 01/2024 (සංශෝධන I)**

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල අදාළ වන කාලසීමාව අනුව 4% සුළු පොළිය ගණනය කළ යුතු ආකාරය**

උක්ත කරුණට අදාළව 2024.04.02 දිනැතිව නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 01/2024 කෙරෙහි කාරුණික අවධානය යොමු කරවමි.

02. ඉහත උපදෙස් ලිපියේ විධිවිධාන අනුව 2023.06.01 දිනට පෙර කාලසීමාවන් වෙනුවෙන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී ඊට අදාළව 4%ක සුළු පොළිය ගණන් බැලිය යුතු ආකාරය ඇතුළත් ආදර්ශ ගණනය කිරීම් හතරක් මේ සමඟ ඇති ඇමුණුම් 01, 02, 03 හා 04 මඟින් ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි.

**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකථනය : 011 2 421786
ෆැක්ස් : 011 2 431413
විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com

**පිටපත :-** ලේකම්, අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය } කරු. දැ.ගැ.ස.

**සේවකයකු දෛනික / අනියම් පදනම මත සේවයේ යෙදී සිටි කාලසීමාව විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා අදාළ කර ගැනීමේ දී එම කාලසීමාව සඳහා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම**

යම් සේවකයෙකු 2006.01.01 දින සිට 2008.11.01 දින දක්වා කාලසීමාව තුළ දෛනික / අනියම් පදනම මත සේවයේ යෙදී ඇත්නම් සහ එම සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනය සඳහා අදාළ කර ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත්නම් ද, එම සේවකයා 2020.12.31 දින සිට විශ්‍රාම ගන්වා ඇත්නම් ද, එසේ විශ්‍රාම ගන්වන ලද අවස්ථාව වන විටත් ඉහත සඳහන් අනියම් සේවා කාලය සඳහා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල් ගෙවා නොමැති නම් එකී කාලසීමාව සඳහා හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කරන ආකාරය පහතින් දක්වා ඇත.

සැ.යු. –

**I.** **මෙහිදී සේවකයා විශ්‍රාම ගන්වන ලද දිනය වන 2020.12.31 දින දක්වා ඔහු දෛනික / අනියම් පදනම මත සේවයේ යෙදී ඇති කාලසීමාවට අදාළව හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම සිදු කළ යුතු ය. එසේ ගණනය කිරීමේ දී ඔහුගේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවා කාලය වෙනුවෙන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා ගෙවිය යුතු දායක මුදල් නියමිත පරිදි ගෙවා ඇති බව උපකල්පනය කෙරේ.**

**II.** **සේවකයා සේවයේ යෙදී සිටිය දී වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් ගෙවීමට කටයුතු කරන්නේ නම්, එම ගෙවීම් කරන දිනට හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම සිදු කළ යුතු ය.**

| වර්ෂය | A | B | C | D | E | F | G | H |
|---|---|---|---|---|---|---|---|---|
| | දින ගණන | වාර්ෂික වැටුප | වාර්ෂික දායක මුදල (B x 6%) | දින ගණනට දායක මුදල (C÷360 x A) | දායක මුදල් එකතුව | සුළු පොලිය (E x 4%) | සුළු පොලිය එකතුව | ගෙවිය යුතු හිඟ දායක මුදල + සුළු පොලිය (E+G) |
| 2006 | 208 | 140,760.00 | 8,445.60 | 4,879.68 | 4,879.68 | 195.19 | 195.19 | 5,074.87 |
| 2007 | 292 | 140,760.00 | 8,445.60 | 6,850.32 | 11,730.00 | 469.20 | 664.39 | 12,394.39 |
| 2008 | 146 | 140,760.00 | 8,445.60 | 3,425.16 | 15,155.16 | 606.21 | 1,270.60 | 16,425.76 |
| 2009 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 1,876.81 | 17,031.97 |
| 2010 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 2,483.02 | 17,638.18 |
| 2011 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 3,089.23 | 18,244.39 |
| 2012 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 3,695.44 | 18,850.60 |
| 2013 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 4,301.65 | 19,456.81 |
| 2014 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 4,907.86 | 20,063.02 |
| 2015 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 5,514.07 | 20,669.23 |
| 2016 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 6,120.28 | 21,275.44 |
| 2017 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 6,726.49 | 21,881.65 |
| 2018 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 7,332.70 | 22,487.86 |
| 2019 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 7,938.91 | 23,094.07 |
| 2020 | 0 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 8,545.12 | 23,700.28 |
| ගෙවිය යුතු හිඟ දායක මුදල + සුළු පොලිය | | | | | | | | **23,700.28** |

**සේවකයකුගේ දෛනික / අනියම් පදනම් මත හා ඉන්පසුව ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පදනම මත සේවයේ යෙදී දෛනික / අනියම් පදනම මත සේවයේ යෙදුණු කාලසීමාව සඳහා ගෙවිය යුතු දායක මුදලෙන් කොටසක් පමණක් ගෙවීම් කර ඇති විට ගෙවිය යුතු හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම.**

යම් සේවකයෙකු 2006.01.01 දින සිට 2008.11.01 දින දක්වා කාලසීමාව තුළ දෛනික / අනියම් පදනම මත සේවයේ යෙදී ඇත්නම් සහ එම සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනය සඳහා අදාළ කර ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත්නම් ද, එම සේවකයා 2020.12.31 දින සිට විශ්‍රාම ගන්වා ඇත්නම් ද, එසේ විශ්‍රාම ගන්වන ලද අවස්ථාව වන විට 2015 වර්ෂයේ දී රුපියල් 5,055.20ක මුදලක් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල් ගෙවා ඇත්නම් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල් නොගෙවූ කාලසීමාව සඳහා හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කරන ආකාරය පහතින් දක්වා ඇත.

සැ.යු. –

I. **මෙහිදී සේවකයා විශ්‍රාම ගන්වන ලද දිනය වන 2020.12.31 දින දක්වා ඔහු දෛනික / අනියම් පදනම මත සේවයේ යෙදී ඇති කාලසීමාවට අදාළව හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම සිදු කළ යුතු ය. එසේ ගණනය කිරීමේ දී ඔහුගේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවා කාලය වෙනුවෙන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා ගෙවිය යුතු දායක මුදල් නියමිත පරිදි ගෙවා ඇති බව උපකල්පනය කෙරේ.**

II. **සේවකයා සේවයේ යෙදී සිටිය දී වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් ගෙවීමට කටයුතු කරන්නේ නම්, එම ගෙවීම් කරන දිනට හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම සිදු කළ යුතු ය.**

| | A | B | C | D | E | F | G | H | I |
|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | දින ගණන | වාර්ෂික වැටුප | වාර්ෂික දායක මුදල (B x 6%) | දින ගණනට දායක මුදල (C÷360 x A) | ගෙවීම් | දායක මුදල් එකතුව | සුළු පොලිය (F x 4%) | සුළු පොලිය එකතුව | ගෙවිය යුතු හිඟ දායක මුදල + සුළු පොලිය (F+H) |
| 2006 | 208 | 140,760.00 | 8,445.60 | 4,879.68 | 0.00 | 4,879.68 | 195.19 | 195.19 | 5,074.87 |
| 2007 | 292 | 140,760.00 | 8,445.60 | 6,850.32 | 0.00 | 11,730.00 | 469.20 | 664.39 | 12,394.39 |
| 2008 | 146 | 140,760.00 | 8,445.60 | 3,425.16 | 0.00 | 15,155.16 | 606.21 | 1,270.60 | 16,425.76 |
| 2009 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 1,876.81 | 17,031.97 |
| 2010 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 2,483.02 | 17,638.18 |
| 2011 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 3,089.23 | 18,244.39 |
| 2012 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 3,695.44 | 18,850.60 |
| 2013 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 4,301.65 | 19,456.81 |
| 2014 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 15,155.16 | 606.21 | 4,907.86 | 20,063.02 |
| 2015 | 0 | 0.00 | 0.00 | 0.00 | **5,055.20** | 10,099.96 | 404.00 | 5,311.86 | 15,411.82 |
| 2016 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 10,099.96 | 404.00 | 5,715.86 | 15,815.82 |
| 2017 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 10,099.96 | 404.00 | 6,119.86 | 16,219.82 |
| 2018 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 10,099.96 | 404.00 | 6,523.86 | 16,623.82 |
| 2019 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 10,099.96 | 404.00 | 6,927.86 | 17,027.82 |
| 2020 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 10,099.96 | 404.00 | 7,331.86 | 17,431.82 |
| ගෙවිය යුතු හිඟ දායක මුදල + සුළු පොලිය | | | | | | | | | **17,431.82** |

**සේවකයකුගේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවා කාලය තුළ වැටුප් රහිත සේවා කාලයන් පවතින අවස්ථාවක එම වැටුප් රහිත කාලසීමාව සඳහා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප සඳහා ගෙවිය යුතු දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම**

යම් සේවකයෙකු 2006.01.01 දින සිට ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයේ යෙදී 2020.12.31 දින සිට විශ්‍රාම ගන්වා අත්නම් සහ ඔහුගේ සේවා කාලය තුළ 2013, 2014 හා 2015 වර්ෂවල වැටුප් රහිත සේවා කාලයක් පවතින අවස්ථාවක වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල් නොගෙවූ එකී වැටුප් රහිත කාලසීමාව සඳහා හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කරන ආකාරය පහතින් දක්වා ඇත.

සැ.යු. –

I. **මෙහිදී සේවකයා විශ්‍රාම ගන්වන ලද දිනය වන 2020.12.31 දින දක්වා ඔහුගේ සේවා කාලය තුළ පවතින වැටුප් රහිත කාලසීමාවන් වෙනුවෙන් හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම සිදු කළ යුතු ය. එසේ ගණනය කිරීමේ දී වැටුප් සහිත සේවා කාලය සඳහා නියමිත පරිදි දායක මුදල් ගෙවා ඇති බව උපකල්පනය කෙරේ.**

II. **මෙම සේවකයා සේවයේ යෙදී සිටිය දී වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් ගෙවීමට කටයුතු කරන්නේ නම්, එම ගෙවීම් කරන දිනට හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම සිදු කළ යුතු ය.**

| | A | B | C | D | E | F | G | H |
|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | වැටුප් රහිත දින ගණන | වාර්ෂික වැටුප | වාර්ෂික දායක මුදල (B x 6%) | දින ගණනට දායක මුදල (C ÷ 360 X A) | දායක මුදල් එකතුව | සුළු පොලිය (E x 4%) | සුළු පොලිය එකතුව | ගෙවිය යුතු හිඟ දායක මුදල + සුළු පොලිය (E+G) |
| 2006 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2007 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2008 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2009 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2010 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2011 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2012 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2013 | 208 | 378,600.00 | 22,716.00 | 13,124.80 | 13,124.80 | 524.99 | 524.99 | 13,649.79 |
| 2014 | 292 | 382,200.00 | 22,932.00 | 18,600.40 | 31,725.20 | 1,269.01 | 1,794.00 | 33,519.20 |
| 2015 | 146 | 385,800.00 | 23,148.00 | 9,387.80 | 41,113.00 | 1,644.52 | 3,438.52 | 44,551.52 |
| 2016 | 0 | 0.00 | 0.00 | 0.00 | 41,113.00 | 1,644.52 | 5,083.04 | 46,196.04 |
| 2017 | 0 | 0.00 | 0.00 | 0.00 | 41,113.00 | 1,644.52 | 6,727.56 | 47,840.56 |
| 2018 | 0 | 0.00 | 0.00 | 0.00 | 41,113.00 | 1,644.52 | 8,372.08 | 49,485.08 |
| 2019 | 0 | 0.00 | 0.00 | 0.00 | 41,113.00 | 1,644.52 | 10,016.60 | 51,129.60 |
| 2020 | 0 | 0.00 | 0.00 | 0.00 | 41,113.00 | 1,644.52 | 11,661.12 | 52,774.12 |
| **ගෙවිය යුතු හිඟ දායක මුදල + සුළු පොලිය** | | | | | | | | **52,774.12** |

**සේවකයකුගේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවා කාලය තුළ වැටුප් රහිත සේවා කාලයන් පවතින අවස්ථාවක එම වැටුප් රහිත කාලසීමාව සඳහා ගෙවිය යුතු දායක මුදලෙන් කොටසක් පමණක් ගෙවීම් කර ඇති විට ගෙවිය යුතු හිඟ දායක මුදල හා 4% සුළු පොලිය ගණනය කිරීම**

යම් සේවකයෙකු 2006.01.01 දින සිට ස්ථිර සේවයේ යෙදී සිටිය දී 2013, 2014 හා 2015 වර්ෂවල වැටුප් රහිත සේවා කාලයක් පවතින අවස්ථාවක එම සේවකයා 2020.12.31 දින සිට විශ්‍රාම ගත්වා අත්නම් ද, එසේ විශ්‍රාම ගන්වන ලද අවස්ථාව වන විට 2017 වර්ෂයේ දී රුපියල් 15,055.20ක වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල් ගෙවා ඇත්නම් ද, වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා දායක මුදල් නොගෙවූ වැටුප් රහිත කාලසීමාව සඳහා හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කරන ආකාරය පහතින් දක්වා ඇත.

**සැ.යු. –**

I. **මෙහිදී සේවකයා විශ්‍රාම ගන්වන ලද දිනය වන 2020.12.31 දින දක්වා ඔහුගේ සේවා කාලය තුළ පවතින වැටුප් රහිත සේවා කාලයන් වෙනුවෙන් හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම සිදු කළ යුතු ය. එසේ ගණනය කිරීමේ දී වැටුප් සහිත සේවා කාලය සඳහා නියමිත පරිදි දායක මුදල් ගෙවා ඇති බව උපකල්පනය කෙරේ.**

II. **මෙම සේවකයා සේවයේ යෙදී සිටිය දී වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් ගෙවීමට කටයුතු කරන්නේ නම්, එම ගෙවීම් කරන දිනට හිඟ දායක මුදල් හා 4% සුළු පොලිය ගණනය කිරීම සිදු කළ යුතු ය.**

| වර්ෂය | A | B | C | D | E | F | G | H | I |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් රහිත දින ගණන | වාර්ෂික වැටුප | වාර්ෂික දායක මුදල (B x 6%) | වැටුප් රහිත දින ගණනට දායක මුදල (C ÷ 360 X A) | ගෙවීම | දායක මුදල් එකතුව | සුළු පොලිය (F x 4%) | සුළු පොලිය එකතුව | ගෙවිය යුතු හිඟ දායක මුදල + සුළු පොලිය (F+H) |
| 2006 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2007 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2008 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2009 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2010 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2011 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2012 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2013 | 208 | 378,600.00 | 22,716.00 | 13,124.80 | 0.00 | 13,124.80 | 524.99 | 524.99 | 13,649.79 |
| 2014 | 292 | 382,200.00 | 22,932.00 | 18,600.40 | 0.00 | 31,725.20 | 1,269.01 | 1,794.00 | 33,519.20 |
| 2015 | 146 | 385,800.00 | 23,148.00 | 9,387.80 | 0.00 | 41,113.00 | 1,644.52 | 3,438.52 | 44,551.52 |
| 2016 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 41,113.00 | 1,644.52 | 5,083.04 | 46,196.04 |
| 2017 | 0 | 0.00 | 0.00 | 0.00 | **15,055.20** | 26,057.80 | 1,042.31 | 6,125.35 | 32,183.15 |
| 2018 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 26,057.80 | 1,042.31 | 7,167.66 | 33,225.46 |
| 2019 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 26,057.80 | 1,042.31 | 8,209.97 | 34,267.77 |
| 2020 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 26,057.80 | 1,042.31 | 9,252.28 | 35,310.08 |
| ගෙවිය යුතු හිඟ දායක මුදල + සුළු පොලිය | | | | | | | | | **35,310.08** |